මුල් පිටපත / අනු පිටපත

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ,

# ප්‍රධාන කාර්යාලය,

# අංක 500, ටී .බී ජයා මාවත, කොළඹ 10

# යන ස්ථානයේ

# පිහිටි ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා වූ

# ප්‍රසම්පාදන පත්‍රිකාව

ලංසුකරුගේ නම ……………………………..

වට්ස්ඇප් අංකය ………………………………

ඊමේල් ලිපින ………………………………

<u>කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා</u>

නිකුත් කරන ලද්දේ :-.......……………

ඇප තැන්පත් කල රිසිට්පත් අංකය :-…........…………

දිනය :-……......………

........................................

……………….

……………………………..

**මෙම ප්‍රසම්පාදන පත්‍රිකාව පිරවීමේදි පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන්න.**

01. මෙම ප්‍රසම්පාදන පත්‍රිකාව "අ" , "ආ" , "ඇ" හා "ඈ" වශයෙන් උපලේඛන 04 කින් සමන්විතය.

02. "අ" උපලේඛනය මඟින් මිල ගණන් ඉදිරිපත් කල යුතු ආකාරය හා අදාල කොන්දේසි ඉදිරිපත් කර ඇත. ඒවා නිසිපරිදි කියවා තේරුම් ගෙන මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

03. "ආ" උපලේඛනය අදාල මුදල් රිසිට්පත් අංකය යොදා නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.

04. "ඇ" උපලේඛනයේ ඇතුලත් සියළුම උපලේඛන සම්පූර්ණ කල යුතුය. එම විස්තර සනාථ කිරිම සඳහා අදාල වූ ලිපි ලේඛන තිබේනම් එම ලේඛන වල ඡායා පිටපත් ප්‍රසම්පාදන පත්‍රිකාවට අමුණා ඉදිරිපත් කල යුතුය.

05. "ඈ" උපලේඛනය මඟින් ආහාර වලට අදාල වූ මිල ගණන් නිවැරදිව සටහන් කර ඉදිරිපත් කල යුතුය.

06. ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් මුදල් ගෙවීමෙන් පසු නිකුත් කරන ලද ප්‍රසම්පාදන පත්‍රිකාව(මුල් පිටපත් හා අනු පිටපත්) පමණක් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි භාරදීම හෝ ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීම කල යුතුය.

07. අසම්පූර්ණ, අපැහැදිලි ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"අ" උපලේඛනය

**<u>……………………………………… පිහිටි ආපන ශාලාව වර්ෂයක් තුල පවත්වාගෙන යාම සඳහා වූ මිල ගණන් ඉදිරිපත් කිරිම හා ඊට අදාල කොන්දේසි</u>**

01. මේ සමඟ අමුණා ඇති "ඇ"දරණ අයදුම්පත් මඟින් අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කළයුතුවේ. මිල ගණන් ඉදිරිපත් කිරීමේදි ආහාරවල ගුණාත්මක භාවය සහ පිරිසිදුකම කෙරෙහි අනිවාර්යෙන්ම ප්‍රමුඛත්වය දැක්විය යුතු අතර, ඒ අනුව සලකා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

02. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන පත්‍රිකාවේ මුල් පිටපත හා අනු පිටපත් වෙන වෙනම ලියුම් කවරවල බහා සීල් තබා ලිපි කවරයේ වම්පස කෙළවරේ "*Bid No ……………..* - ආපන ශාලාව සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම" යනුවෙන් සඳහන් කර **2026.05.22** වැනි දින ප:ව: **2.00** ට ප්‍රථම අංක 500, ටී.බී ජයා මාවත, කොළඹ 10 පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ලිපි කවරයේ මුල් පිටපත සහ අනු පිටපත පැහැදිලිව සටහන් කල යුතුය.

03. **2026.05.22** දින **ප.ව 2.00** ට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ 9වන මහලේ පිහිටි ප්‍රසම්පාදන කමිටු කාමරයේ දී ඉදිරිපත් කරන ලද මිල ගණන් විවෘත කරනු ලබන අතර, මිල ගණන් ඉදිරිපත් කරන ලද අයට හෝ විධිමත් ලෙස බලය පවරා ඇති ඔහුගේ නියෝජිතයෙකුට (උපරිම දෙදෙනෙකුට) හෝ ඊට සහභාගි විය හැකිය.

04. ඉදිරිපත් කරන ලද ඕනෑම මිල ගණන් පත්‍රයක් ලංසු ඇගයීමෙන් පසු ප්‍රතික්ෂේප කිරීමේ බලය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා අයෙකු තෝරා ගැනීම සඳහා සුදුසුකම් පරික්ෂා කර බැලීමට පහත සඳහන් ලිපි ලේඛන ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

i. දැනටමත් පවත්වාගෙන යන ආපන ශාලා වේ නම්, එම තොරතුරු

ii ආපන ශාලා පවත්වාගෙන යාම සඳහා කලින් ලබා ගෙන ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර

iii මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයගේ වත්කම් පිළිබඳ තොරතුරු (ගිණුම් විස්තර)

iv. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක්

v. ආහාර පාන සැකසීම, හෝටල් පරිපාලනය පිළිබඳ ලබා ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික (ඇත්නම් පමණක්)

05. පිළිගනු ලබන සේවා සැපයුම්කරු විසින් මුදලින් රු.150,000.00 ක් ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුවක් ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු අතර, මූලික වශයෙන් මාස 03ක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත්තුව වලංගු වේ. එම මාස 03ක කාලය තුල ආපන ශාලාව සතුටුදායක මට්ටමින් පවත්වාගෙන යාම හා ආහාර වල ගුණාත්මක භාවය මත මෙම කොන්ත්‍රාත්තුව තවත් මාස 09ක කාලයක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

06. ආපන ශාලා සේවය ඇරඹීමට ප්‍රථම සේවා සැපයුම්කරු විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. අදාල කොන්ත්‍රාත්කරු විසින් මෙම ගිවිසුම කඩ කරන අවස්ථාවකදී හෝ සේවා සැපයීම සතුටු දායක නොවන අවස්ථාකදී කොන්ත්‍රාත්තුව අවලංගු කර ප්‍රසම්පාදන අනුව ඊලඟ ඉල්ලුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ලබා දිය යුතුය. එහිදී අවලංගු කරන ලද සැපයිම්කරුගේ ආපසු ගෙවන තැන්පතු මුදල මාස 6ක කාලයකින් පසු ගෙවීම සිදු කල යුතුවේ.

07. ආපන ශාලාවට විදුලිය නොමිලේ සපයන අතර ජලය සැපයීම වෙනුවෙන් ආපන ශාලාවේ සවිකර ඇති මාපංක දර්ශකයට අනුව මාසිකව ගාස්තු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගණකාධිකාරී (ගෙවීම්) වෙත ගෙවිය යුතුය.

08. රු.10,000.00 ක මාසික කුලියක් සෑම මසකම 10 වන දින ඉක්මවා යාමට පෙර ගෙවිය යුතු අතර, ඉහත සියලු ගෙවීම් ගණකාධිකාරී (ගෙවීම්) වෙත ගෙවිය යුතුය. බදු කුලිය හා ජලබිල්පත් මාස 3කට වඩා හිඟ මුදල් නොගෙවන්නේනම් ගිවිසුම කඩ වීමක් ලෙස සලකා කොන්ත්‍රාත්තුව අවසන් කල යුතුවේ.

09. කොන්ත්‍රාත්කරුගෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයවිය යුතු ඕනෑම මුදලක් ඔහුගේ ඇප තැන්පතුවෙන් අය කර ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු අතර කොන්ත්‍රාත් කාල සීමාව අවසානයේදි එම තැම්පත් මුදල නිදහස් කෙරේ (ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අය විය යුතු මුදලක් ඇත්නම් ඒ හැර). ඇප තැන්පතු සඳහා පොළී මුදලක් ගෙවනු නොලැබේ.

10. ආපන ශාලාව තුල භාවිතය සඳහා පිඟන්, කෝප්ප, වීදුරු, පුටු හා මේස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සපයන අතර එවා මනාව භාවිතා කිරීමේ වගකීම කොන්ත්‍රාත්කරු වෙත පැවරේ. ඒ සඳහා යම් අයුරකින් හානි සිදු වුව හොත් එහි අලාභය (එහි වෙළඳපල අගය) හානිය සිදු කල අයගෙන් අයකර ගැනීම සිදු කල යුතුය. පරික්ෂා කරන අවස්ථාවේ හානි වී හෝ අස්ථාන ගත වීමක් සිදුව ඇත්නම් එහි වටිනාකම කොන්ත්‍රාත්කරු විසින් මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතුය.

11.ආපන ශාලා අධීක්ෂණය කිරීමේ අයිතිය අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සංවර්ධන) හෝ පත් කර ඇති ආපනශාලා කළමනාකරණ කමිටුවේ නිළධාරින් සතුය.

12. අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කල ආහාර මිල දර්ශනයක් පැහැදිලි ලෙස ආපන ශාලාව තුල **අනිවාර්යෙන්ම** ප්‍රදර්ශනය කල යුතු අතර පැමිණිලි සඳහන් කිරීමට පොතක් ද තැබිය යුතු ය.

13.අනුමත කරන ලද මිල ගණන් ලැයිස්තුවේ දැක්වෙන ආහාර පිරිසිදු හා ගුණාත්මක භාවයෙන් යුක්තව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යය මණ්ඩලයට ප්‍රමාණවත් වන පරිදි ආපනශාලාවේ අලෙවි කරන බවට සේවා සැපයුම්කරු එකඟ විය යුතුය. විශේෂ හේතූන් මත හෝ අනුමත ලැයිස්තුවේ සඳහන් නොවන ආහාර ආපන ශාලාවේ අලෙවි කිරීමට සිදුවන්නේ නම් ඒ සඳහා ආපනශාලා කලමනාකරණ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය කලින් ලබා ගත යුතුය. එසේ අනුමැතිය කලින් ලබා නොගත් ආහාර වර්ග ආපනශාලාවේ අලෙවි කිරිම කොන්ත්‍රාත් ගිවිසුම අහෝසි කිරීමට හේතු වන බව සේවා සැපයුම්කරු පිළිගත යුතුය.

14.ආපන ශාලාවේ තදබදය අවම කිරිම සඳහා අවම වශයෙන් සේවකයින් 04 දෙනෙකු වත් සේවයේ යෙදවිය යුතුය. සෑම සේවකයෙක්ම විනීතව හැසිරිය යුතු අතර විනීතව කතා බහ කල යුතුය. කිසිම සේවකයෙකුට අවිනීතව අපිරිසිදුව හැසිරිමට ඉඩක් නොතැබිය යුතුය. එසේ අවිනීතව අපිරිසිදුව හැසිරෙන යම් සේවකයෙකු වෙතොත් අපනශාලා කළමනාකරණ කමිටුව දැනුවත් කිරිම හා අධ්‍යක්ෂ ජනරාල්ගේ දැනුම්දිම මත ඔහුගේ සේවය වහාම නවතාලීමට සේවා සැපයුම්කරු එකඟ විය යුතුය.

15.ආපන ශාලාව පිරිසිදුව පවත්වාගෙන යාම සේවා සැපයුම්කරුගේ වගකීමක් වන අතර **විශේෂයෙන්ම ආහාර වර්ග පිඟන් වලට බෙදීමේදිත්, පැකට් කිරිමේදිත්, අතින් ඇල්ලීම වෙනුවට ඒ සඳහා සුදුසු උපකරණ අනිවාර්යෙන්ම භාවිතා කළ යුතුය.**

16. ආපන ශාලාව තුල මධ්‍යසාර විකිණිම හෝ පානය කිරීම සපුරා තහනම් වේ. එමෙන්ම දුම්වැටි සහ දුම්කොළ අඩංගු නිෂ්පාදන අලෙවි කිරිමද තහනම් වේ. (රාජ්‍ය ආයතන වල දුම්වැටි මත්පැන් අලෙවි නොකිරිමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව)

17. ආපනශාලා බලපත්‍ර ගාස්තුව හා වෙනත් ගාස්තු වේ නම් එම ගාස්තු සේවා සැපයුම්කරු විසින් දැරිය යුතුය.

18. භෝජනාගාරයේ සේවයේ යෙදෙන අයගේ නම් ලිපිනයන් හා පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේනතුව මඟින් නිකුත්කර ඇති හැඳුනුම්පත් අංක සඳහන් ලැයිස්තුවක් ආපනශාලා කලමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කල යුතුය. ඒ පිළිබඳ පසුව ඇතිවන වෙනස්කම් වලදී ද ඒ බව දැන්විය යුතුය.

19. සාමාන්‍ය වැඩ කරන දින වල පෙ:ව: 7.00 සිට ප:ව: 5.00 දක්වාද අවශ්‍ය වෙතොත් රජයේ නිවාඩු දින වල පෙ:ව: 9.00 සිට ප:ව: 2.00 දක්වා සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන පරිදි වෙනත් දින වලද ආහාර සැපයිමට සේවා සැපයුම්කරු එකඟ විය යුතුය.

20. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක කටයුතු වල නිරතව සිටින ආරක්ෂක නිලධාරින් සමඟ සේවා සැපයුම්කරු සහයෝගයෙන් කටයුතු කල යුතු වන අතර ප්‍රධාන කාර්යාල භූමිය තුලට ඇතුල්වීමේදි හා පිටවීමේදි රැගෙන යන පාර්සල් පරික්ෂා කිරිමට ඉඩ දිය යුතුය. එමෙන්ම ආපනශාලාව සඳහා ආහාර ද්‍රව්‍ය රැගෙන එන පිටස්තර වාහන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ භූමිය තුලට ඇතුල් කිරිම සඳහා අධ්‍යක්ෂ ජනරාල්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන/පාලන හා මුදල් /තාක්ෂණ සේවා) ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

21. අත්සන් කරන ගිවිසුමේ උපලේඛනයේ සඳහන් කළ මිල ගණන් යටතේ සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඊට පසුව අනුමත කරනු ලබන සංශෝධිත උපලේඛන වල සඳහන් මිල ගණන් යටතේ පමණක් සේවා සැපයුම්කරු විසින් ආහාරපාන සැපයීම කළ යුතුය.

22. කවර හේතුවක් නිසා හෝ වෙනත් ස්ථානවල අලෙවි කිරීම සඳහා මෙම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආපනශාලාව තුල ආහාරපාන සකස් නොකළ යුතුය.

23. ආපන ශාලාව තුල ඇති ආහාරපාන මීයන්, මැස්සන් වැනි සතුන්ගෙන්, කෘමීන්ගෙන් හා දූවිලි වලින් අපවිත්‍ර නොවන ලෙසට ආරක්ෂාකාරීව තබා ගැනීමට සේවා සැපයුම්කරු වග බලා ගත යුතුය.

24. කොන්ත්‍රාත්කරුගේ ආපන ශාලා සේවය අසතුටුදායක වීම හෝ කොන්ත්‍රාත්කරු විසින් මෙහි ඉහත සඳහන් ගිවිසුමේ කොන්දේසි කඩකිරීම වැනි හේතූන් මත කරුණු විමසීමකින් පසුව මාස 3 කාලයකින් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ අයිතිය අධ්‍යක්ෂ ජනරාල් සතුය. එසේ ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් වන්දියක් ඉල්ලා සිටීමේ අයිතියක් සේවා සැපයුම්කරුට නැත. තවද සැපයුම්කරු විසින් කොන්ත්‍රාත්තුව අවසන් කිරිමට අදහස් කරන්නේනම් ඒ පිළිබඳ මාස 6කට ප්‍රථම දැනුම් දිය යුතුය.

25. ආපන ශාලාව පවත්වාගෙන යන කාලය අතරතුරදී අධ්‍යක්ෂ ජනරාල් විසින් අවශ්‍ය වුවහොත් වරින්වර පනවනු ලබන **නීති රීති හා උපදෙස්වලට** එකඟව කටයුතු කළ යුතුය.

26. උදැසන ආහාරය සඳහා බත් සැපයීමේදී ව්‍යංජන 2ක් සමග මස් /මාළු හෝ බිත්තර ඇතුලත් විය යුතු අතර අවශ්‍ය වුවහොත් ආපනශාලා කළමනාකරණ කමිටුවේ නිලධාරියෙකු විසින් සෑම දිනකම බත් සමග සැපයිය යුතු වෑංජන වට්ටෝරුව සෑම සතියකටම හෝ දෙසතියකටම වරක් ලබාදෙන අතර එම වට්ටෝරුවට අනුව උදැසන බත් සැපයිය යුතුය. මීට අමතරව පාන්, ඉදිආප්ප, නූඩ්ල්ස්, කිරිබත්, කඩල, මුංඇට, බතල, පරාටා, තොසේ, වැනි උදැසන අහාර වර්ග අවම වශයෙන් 5ක් හෝ තිබිය යුතුය. අනිවාර්යයෙන්ම උදැසන ආහාරය සඳහා අවම වශයෙන් එක් ධාන්‍ය වර්ගයක් හෝ අලෙවි කල යුතුය.

27. දිවා ආහාරය සඳහා බත් සැපයීමේදී වර්ග කීපයක ව්‍යංජන 3ක් සමග මස් හෝ මාළු හෝ බිත්තර සැපයිය යුතුය. අවශ්‍ය වුවහොත් ආපනශාලා කළමනාකරණ කමිටුව විසින් ඔහුගේ බලය පවරන ලද නිලධාරියෙකු විසින් සතියකට හෝ දෙසතියකට වරක් වෑංජන වට්ටෝරුව ලබාදෙන අතර එම වට්ටෝරුවට අනුව ව්‍යංජන ලබා දිය යුතුය.

28.පෝෂ්‍යදායි ආහාර වේලක් ලබාදිම සම්බන්ධයෙන් රජය විසින් ඉදිරිපත් කරන පොදු නීතිරීති හා කොන්දෙසි වලට එකඟවිය යුතුය. 2025.09.16 වන දින ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය විසින් පෝෂදායි ආහාර වේලක් සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇත.(සුදු හො රතු බත්කොප්ප 1 ½ , එළවළු 2, පලා වර්ගයින් මේස හැදි 3ක් , පරිප්පු කරිය මේස හැදි 3ක් ,බිත්තරයක් හෝ මාළු කැබැල්ලක් වශයෙන් මුළු බර ග්‍රෑම් 450- 475 විය යුතුය. ඒ සඳහා ගාස්තුව රු 200- 250 අතර විය යුතු බව දන්වා ඇත.)

29. අහාර ද්‍රව්‍ය හා යටිතල පහසුකම් වල වෙළඳපල මිල ගණන් වැඩි වීම මත ආහාරපානවල මිල ගණන් වෙනස් කිරිමට කරනු ලබන ඉල්ලීම් සඳහා ආපනශාලා කලමනාකරණ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය යටතේ සිදු වේ. එසේම එම ද්‍රව්‍ය වල මිල ගණන් අඩු වීමකදී ද ආහාරපානවල මිල ගණන් වෙනස් කිරිමට සේවා සැපයුම්කරු එකඟ විය යුතුය.

30. බත් සමග කුකුළු මස් සැපයීමේ දී සම රහිත මස් සැපයිය යුතුය.

31. ආහාර පිසීමට ගන්නා තෙල් එක් වතාවක් භාවිතා කිරීමෙන් පසු නැවත භාවිතයට ගැනීමට ඉඩ දෙනු නොලැබේ. එසේ භාවිතයට ගන්නා තෙල් භාවිතයට පෙර/භාවිතා කරන අතරතුරදී පරික්ෂා කරනු ලැබේ.

32. ආපනශාලා කළමනාකරණ කමිටුවේ නිලධාරීන් විසින් ආපන ශාලාවේ සහ ආහාරවල තත්වයන් නිරන්තර දැඩි පරීක්ෂාවන්ට ලක් කිරීම සිදු කරනු ලබයි.

33. කෑම ඇසුරුම් කිරීමේදී පත්තර කඩදාසි වැනි මුද්‍රිත කඩදාසි වර්ග භාවිතා නොකළ යුතු අතර සුදු කඩදාසි භාවිතා කළ යුතුය.

34. ආහාරවලට කෘත්‍රිම රස කාරක සහ වෙනත් ආදේශක වර්ග යොදා ගැනීම නොකල යුතුය.

35. ආපන ශාලාව සඳහා නිරෝගී ප්‍රිය මනාප කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවිය යුතු අතර, දෛනිකව අපද්‍රව්‍ය බැහැර කිරීම සිදුකල යුතුය. ආපන ශාලාව පිටත ( කානු පද්ධතිය හා වට පිටාව ) හා ආපනශාලාව ඇතුළත සෑම අවස්ථාවක දීම පිරිසිදුව තබා ගත යුතුය.

36. කාර්යය මණ්ඩලයේ සියලුම දෙනා පිරිසිදු ඇඳුමකින් සැරසී සිටිය යුතුය. මෙම උප ලේඛනයේ 14 ඡේදයේ සඳහන් පරිදි අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත් කාර්යය මණ්ඩල සාමාජිකයින් පමණක් ආපන ශාලා සේවාවේ යෙදවිය යුතු අතර, කවර අවස්ථාවක දී හෝ පිටස්තර පිරිස් ආහාර සකස් කිරීමේ, පිළිගැනීමේ හෝ ආපන ශාලාවේ වෙන යම් කාර්යයක් සඳහා සහභාගි කර නොගත යුතුය.

37. ආරක්ෂිත කැමරා පද්ධතිය භාවිතයෙන් ආපනශාලා කළමනාකරණ කමිටුව වෙත නිරන්තරයෙන් පරික්ෂා කිරීම සඳහා අවස්ථාව ලබාදිය යුතුය.

38. ආපනශාලාවේ විදුලි පංකා , ජනේල් හා පොළව මතුපිට පිරිසිදු කිරීම සැපයුම්කරු විසින් සිදු කල යුතුය.

39. ආපනශාලාවේ කාර්යය මණ්ඩලය නිශ්චිතව හඳුනා ගැනීම සඳහා සුදුසු ඇඳුමක් භාවිතා කල යුතුය.තවද අරක්කැමියන් සඳහා ඇඳුම් ආවරණයක් (ඒප්‍රන්) භාවිතා කල යුතුය.

40. සවස තේ සඳහා කෙටි ආහාර ලබාදීමේදී ඒවා නැවුම් විය යුතු අතර අවම වශයෙන් කෙටි ආහාර වර්ග 3ක් වත් තිබිය යුතුය. මේ සඳහා උදැසන ඉතිරි වූ කෙටි ආහාර භාවිතා නොකළ යුතුය.

41. ලංසු ඇගයීමේ ක්‍රියාපටිපාටිය.

a) ලංසුකරු සතුව අවම වශයෙන් වසරක කාලයක් හෝ මෙවැනි ආපන ශාලාවක් පවත්වාගෙන යාම පිළිබඳව
පළපුරුද්දක් තිබිය යුතු අතර ඒ පිලිබඳව තහවුරු කිරීමේ ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය.

b) තවද ඉහත (a) හි සඳහන් සේවාව එම ආයතනය වෙත සතුටුදායක මට්ටමෙන් පවත්වාගෙන ගොස් තිබිය යුතුය. (ඒ බව තහවුරු කිරීමේ ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය)

c) "ඇ" උපලේඛනයේ සඳහන් වට්ටෝරු අංක 5, 7, 9, 12, 18 , 19, 30, 31, 32, 33, 34, 35, 36, 38, 41-59, 62, 71, 72 හා 77 සඳහා ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන අවම මිල ගණන් ලංසු ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

"ආ" උපලේඛනය

මිල ගණන් ඉදිරිපත් කිරීමේ අයදුම්පත සඳහා:
තැන්පත් මුදල් ගෙවීමේ කුවිතාන්සි අංකය :
දිනය :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
ප්‍රධාන කාර්යාලය
අංක 500, ටී බී ජයා මාවත,
කොළඹ 10.

මා තෝරාගනු ලැබුවහොත් මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් දන්වා ඇති කොන්දේසි මත හා මහවැලි නිලධාරින් ඇතුළුව පැමිණෙන සියළුම පාරිභෝගිකයින් සෑහිමට පත්වන ආකාරයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාවේ වර්ෂයක් තුල පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සංවර්ධන) විසින් දැනුම් දෙනු ලබන ඕනෑම දිනයකදී පොලියක් නොමැතිව ආපසු ගෙවනු ලබන මුදලින් රු. 150,000.00 ක් ඇපයක් තැබීමට ද, සෑම මසකම 10 වන දින ඉක්මවා යාමට මත්තෙන් මාසික කුලිය වශයෙන් රු.10,000.00 ක් ගෙවීමට ද ආපන ශාලාවේ මාසික විදුලි හා ජල බිල්පත් මෙහි සඳහන් කර ඇති ආකාරයට පියවීමට ද එකග වෙමි.

02. මා හට සැපයිය හැකි ආහාරපාන මිල ගණන් මෙයට අමුණා ඇති "ඇ" ආකෘතියේ දැක්වේ.

03. “ඇ” උපලේඛනයේ සඳහන් පහත විස්තර සඳහා වන සහතික මෙයට අමුණා ඇත. (සහතික වල මුල් පිටපත් නියෝග කල විට ඉදිරිපත් කරමි.)

i. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර.

ii. දැනට මා විසින් පවත්වාගෙන යනු ලබන වෙනත් ආපන ශාලා පිළිබඳ විස්තර.

iii. ආපන ශාලා පවත්වාගෙන යාමේ කලින් ලබා ඇති පලපුරුද්ද පිළිබඳ විස්තර.

iv. ආපන ශාලාවක් පවත්වාගෙන යාමට අදාල වූ මගේ වත්කම් පිළිබඳ විස්තර.

මිල ගණන් ඉදිරිපත් කරන්නාගේ නම :...........................................................................

ලිපිනය : ......................................................................................................................

දිනය: ......................................

මිල ගණන් ඉදිරිපත් කරන්නාගේ අත්සන

**“ඇ” උප ලේඛනය**

04. ආපන ශාලාවක් පවත්වාගෙන යාමට අදාළ වූ ඔබ සතු මූලා හා වෙනත් වත්කම් / උපකරණ පිළිබඳ විස්තර

1.

2.

3.

4.

5.

05. ආහාර සේදීම / අළුත් එළවළු වර්ග ලබා ගැනීමේ ක්‍රමවේද /අලවියේදී උණුසුම්ව පවත්වා ගැනීම හා ආවරණය සහිතව තැබීම / නැවුම් ආහාර අලෙවිය පිළිබඳ ඔබට ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

1.

2.

3.

4.

5.

06. යොදවනු ලබන සේවක / සේවිකාවන් පිළිබඳ විස්තර.

| **සේවක /සේවිකා වෘත්තිය** | **අවශ්‍ය ගණන** | **සැපයිය හැකි ගණන** |
|---|---|---|
| 1. අරක්කැමි | 02 | |
| 2.අත් උදව්කරු | 02 | |
| 3.ආහාර අලෙවිකරුවන් / මුදල් අයකැමි | 02 | |

07. දැනට පවත්වාගෙන යනු ලබන වෙනත් ආපන ශාලා පිළිබඳ විස්තර

| **ආයතනයේ නම** | **පවත්වාගෙනයනු ලබන කාල සීමාව** | **දිනකට ආහාර සපයනු ලබන පුද්ගල සංඛ්‍යාව** | **සනාථ කිරීම සඳහා අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා ඇති/නැති බව** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

08. කලින් පවත්වාගෙන යන ලද ආපන ශාලා පිළිබඳ විස්තර

| ආයතනයේ නම | පැවැත්වූ කාල සීමාව | දිනකට ආහාර සැපයූ පුද්ගල සංඛ්‍යාව | සනාථ කිරීම සඳහා අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා ඇති / නැති බව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඇ උපලේඛනයේ 04 සිට 08 දක්වා සඳහන් සියලු තොරතුරු නිවැරදි බවට සහතික වෙමි. තවද අදාල තොරතුරු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛනයන්හි මුල් පිටපත් නියෝග කල විට ඉදිරිපත් කරමි.

.................................. ........................................................

දිනය මිල ගණන් ඉදිරිපත් කරන්නාගේ අත්සන

මිල ගණන් ඉදිරිපත් කරන්නාගේ නම :..........................................................................

ලිපිනය : ..........................................................................................................................

"ඇ" උපලේඛනය

**2026 / 27 වර්ෂය සඳහා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම**

| අංකය | අයිතමය | ප්‍රමාණය | අපේක්ෂිත උපරිම මිල රු | ඉදිරිපත් කරන මිල |
|---|---|---|---|---|
| 1 | පාන් ¼ (ග්‍රෑම්112.5 ) | එකක් | 35 | |
| 2 | රෝස් පාන් (ග්‍රෑම්112.5) | එකක් | 40 | |
| 3 | හාල් පිටි පිට්ටු (ග්‍රෑම් 112.5) ලුණු මිරිස් සහ කිරිහොදි හෝ පොල් කිරි සමඟ | එකක් | 100 | |
| 4 | පාන් පිටි පිට්ටු (ග්‍රෑම් 112.5) ලුණු මිරිස් සහ කිරිහොදි හෝ පොල් කිරි සමඟ | එකක් | 100 | |
| 5 | හාල් පිටි ඉඳි ආප්ප 10ක් පොල් සම්බල් සහ කිරිහොදි සමඟ | එක් වේලක් | 100 | |
| 6 | අමතර හාල් පිටි ඉඳි ආප්ප | එකක් | 7 | |
| 7 | පාන් පිටි ඉඳි ආප්ප 10ක් පොල් සම්බල් සහ කිරිහොදි සමඟ | එක් වේලක් | 100 | |
| 8 | අමතර පාන් පිටි ඉඳි ආප්ප | එකක් | 7 | |
| 9 | පාන් පිටි පොල් රොටී (ග්‍රෑම් 56) ලුණු මිරිස් සමඟ | එකක් | 50 | |
| 10 | මස් රොටී (ග්‍රෑම් 56) | එකක් | 70 | |
| 11 | මාළු රොටි (ග්‍රෑම් 56) | එකක් | 60 | |
| 12 | එළවළු රොටි (ග්‍රෑම් 56) | එකක් | 50 | |
| 13 | සාමාන්‍ය ගෝදම්බ රොටි | එකක් | 40 | |
| 14 | හාල් පිටි ආප්ප (ග්‍රෑම් 84) | එකක් | 25 | |
| 15 | බතල දීසියක් (ලුණු මිරිස් සහ පොල් සමඟ) ග්‍රෑම් 170 | එකක් | 130 | |
| 16 | මඤ්ඤොක්කා දීසියක් (ලුණු මිරිස් සහ පොල් සමඟ) ග්‍රෑම් 170 | එකක් | 130 | |
| 17 | මුං ඇට දීසියක් (ලුණු මිරිස් සහ පොල් සමඟ) ග්‍රෑම් 170 | එකක් | 130 | |
| 18 | කඩල දීසියක් (ලුණු මිරිස් සහ පොල් සමඟ) ග්‍රෑම් 170 | එකක් | 130 | |
| 19 | කව්පි දීසියක් (ලුණු මිරිස් සහ පොල් සමඟ) ග්‍රෑම් 170 | එකක් | 130 | |
| 20 | තෝසේ (ග්‍රෑම් 84) සුදුසු ව්‍යංජනයක් සමඟ | එකක් | 60 | |
| 21 | පැණි ආප්ප (ග්‍රෑම් 84) | එකක් | 40 | |
| 22 | ටී බනිස් (ග්‍රෑම් 112.5) | එකක් | 50 | |
| 23 | ජෑම් බනිස් (ග්‍රෑම් 112.5) | එකක් | 60 | |
| 24 | සීනි බනිස් (ග්‍රෑම් 112.5) | එකක් | 60 | |
| 25 | මාළු පාන් (ග්‍රෑම් 112.5) | එකක් | 70 | |
| 26 | බිත්තර පාන් (ග්‍රෑම් 112.5) | එකක් | 80 | |

| | | | | |
|---|---|---|---|---|
| 27 | මස් පාන් (ග්‍රෑම් 112.5) | එකක් | 80 | |
| 28 | පරිප්පු වඩේ (ග්‍රෑම් 84) | එකක් | 25 | |
| 29 | උළුඳු වඩේ (ග්‍රෑම් 84) | එකක් | 60 | |
| 30 | නූඩ්ල්ස් පිඟානක් (ග්‍රෑම්225) තම්බපු බිත්තරයක් සමඟ | එක් වේලක් | 160 | |
| 31 | පාන් ½ පරිප්පු /අල හෝ වෙනත් හොදි සමඟ පොල් සම්බල් | එක් වේලක් | 140 | |
| 32 | කිරිබත් කැටයක් (ග්‍රෑම් 84) ලුණු මිරිස් සමඟ | එකක් | 50 | |
| 33 | උදැසන බත් (පිඟානක්) - සම්බා වර්ගයේ සහලින් පිසූ බත් (ග්‍රෑම් 250) ව්‍යංජන 2 ක් මස්, මාළු හෝ බිත්තර සමග (මුළු බර ග්‍රෑම් 400 අවම වශයෙන්) | එක් වේලක් | එළවළු 120<br>මාළු 160<br>මස් 200 | |
| 34 | උදැසන බත් (පිඟානක්) - රතු කැකුළු වර්ගයේ සහලින් පිසූ බත් (ග්‍රෑම් 250) ව්‍යංජන 2ක් මස්, මාළු හෝ බිත්තර සමග (මුළු බර ග්‍රෑම් 400 අවම වශයෙන්) | එක් වේලක් | එළවළු 120<br>මාළු 160<br>මස් 200 | |

<u>උණුසුම් පාන වර්ග</u>

| අංකය | සැපයිය යුතු ආහාර වර්ගය | ප්‍රමාණය | අපේක්ෂිත උපරිම මිල | ඉදිරිපත් කරනු ලබන මිල |
|---|---|---|---|---|
| 35 | සීනි සහිත තේ කෝප්පයක් | එකක් | 20 | |
| 36 | සීනි සහිත කිරි තේ කෝප්පයක් | එකක් | 70 | |
| 37 | කහට තේ කෝප්පයක | එකක් | 20 | |
| 38 | කිරි කහට තේ කෝප්පයක් | එකක් | 70 | |
| 39 | කෝපි කෝප්පයක් | එකක් | 50 | |
| 40 | කිරි කෝපි කෝප්පයක් | එකක් | 70 | |
| 41 | හකුරු සමග තේ කෝප්පයක් | එකක් | 20 | |
| 42 | බිත්තර කෝපි කෝප්පයක් | එකක් | - | |
| 43 | එළකිරි මිලි ලීටර 200ක වීදුරුවක් | එකක් | 80 | |
| 44 | සවු කැඳ මිලි ලීටර 200ක වීදුරුවක් | එකක් | 100 | |
| 45 | කොළ කැඳ මිලි ලීටර 200ක වීදුරුවක් | එකක් | 100 | |

<u>දිවා ආහාරය</u>

| අංකය | සැපයිය යුතු ආහාර වර්ගය | ප්‍රමාණය | අපේක්ෂිත උපරිම මිල | ඉදිරිපත් කරනු ලබන මිල |
|---|---|---|---|---|
| 46 | කුකුල් මස් සමග කැකුළු බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 280 | |
| 47 | එම භාග | එකක් | 250 | |
| 48 | මාළු සමග කැකුළු බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 200 | |
| 49 | එම භාග | එකක් | 180 | |

| | | | | |
|---|---|---|---|---|
| 50 | එළවළු සමග කැකුළු බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 150 | |
| 51 | එම භාග | එකක් | 130 | |
| **අංකය** | **සැපයිය යුතු ආහාර වර්ගය** | **ප්‍රමාණය** | **අපේක්ෂිත උපරිම මිල** | **ඉදිරිපත් කරනු ලබන මිල** |
| 52 | කුකුල් මස් සමග සම්බා බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 280 | |
| 53 | එම භාග | එකක් | 250 | |
| 54 | මාළු සමග සම්බා බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 220 | |
| 55 | එම භාග | එකක් | 180 | |
| 56 | බිත්තර සමග සම්බා බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 200 | |
| 57 | එම භාග | එකක් | 160 | |
| 58 | එළවළු සමග සම්බා බත් පිගානක් හෝ පාර්සලයක් (සම්පූර්ණ කෑම) | එකක් | 160 | |
| 59 | එම භාග | එකක් | 140 | |
| 60 | අමතර කැකුළු බත් පීරිසියක් | එකක් | 40 | |
| 61 | අමතර සම්බා බත් පීරිසියක් | එකක් | 40 | |
| 62 | චිකන් ෆ්‍රයිඩ් රයිස් (ග්‍රෑම් 400) | එකක් | 350 | |
| 63 | එළවළු ෆ්‍රයිඩ් රයිස් (ග්‍රෑම් 400) | එකක් | 200 | |
| 64 | මිරිසට පිසූ මාළු දීසියක් (ග්‍රෑම්56) | එකක් | 60 | |
| 65 | කිරට පිසූ මාළු දීසියක් (ග්‍රෑම්56) | එකක් | 70 | |
| 66 | මාළු ඇඹුල් තියල් දීසියක් (ග්‍රෑම්56) | එකක් | 70 | |
| 67 | මිරිසට පිසූ කුකුල් මස් දීසියක් (ග්‍රෑම්56) | එකක් | 120 | |
| 68 | මිරිසට පිසූ හරක් මස් දීසියක් (ග්‍රෑම්56) | එකක් | 120 | |
| 69 | බැදපු කුම්බලා මාළු (භාගයක්) | එකක් | 80 | |
| 70 | බැදපු හුරුල්ලෙක් | එකක් | 70 | |
| 71 | පරිප්පු පීරිසියක් (හොදි සමග) | එකක් | 60 | |
| 72 | අල හොදි පීරිසියක් (අල කෑලි 01ක් සමග) | එකක් | 60 | |
| 73 | බැදපු අර්තාපල් පීරිසියක් | එකක් | 50 | |
| 74 | බැදපු හාල්මැස්සො හෝ කරවල පීරිසියක් | එකක් | 60 | |
| 75 | තම්බපු බිත්තර | එකක් | 50 | |
| 76 | බාගෙට තම්බපු බිත්තර | එකක් | 50 | |
| 77 | බිත්තරයක් සහිත කිරිහොදි දීසියක් | එකක් | 100 | |

| | | | | |
|---|---|---|---|---|
| 78 | බිත්තර ඔම්ලට් | එකක් | 50 | |
| 79 | සීනි සම්බල් දීසියක් | එකක් | 40 | |
| 80 | බිත්තර (බුල්ස් අයි) | එකක් | 50 | |

<u>අතුරු පස</u>

| අංකය | සැපයිය යුතු ආහාර වර්ගය | ප්‍රමාණය | අපේක්ෂිත උපරිම මිල | ඉදිරිපත් කරනු ලබන මිල |
|---|---|---|---|---|
| 81 | යෝගට් | එකක් | පාලන මිල | |
| 82 | අයිස්ක්‍රීම් | කප් එකක් | පාලන මිල | |
| 83 | පළතුරු සලාදයක් (අයිස්ක්‍රීම් සහිත) | | 150 | |
| 84 | පළතුරු සලාදයක් (අයිස්ක්‍රීම් රහිත) | කප් එකක් | 100 | |
| 85 | වටලප්පම් කප් | එකක් | පාලන මිල | |
| 86 | ජෙලි කප් | එකක් | පාලන මිල | |

<u>ස්වීට් කෑම</u>

| අංකය | සැපයිය යුතු ආහාර වර්ගය | ප්‍රමාණය | අපේක්ෂිත උපරිම මිල | ඉදිරිපත් කරනු ලබන මිල |
|---|---|---|---|---|
| 87 | වැලි තලප කෑලි | එකක් | 60 | |
| 88 | අළුවා කෑලි | එකක් | 60 | |
| 89 | දොදොල් කෑලි | එකක් | 70 | |
| 90 | මස්කට් කෑලි | එකක් | 60 | |
| 91 | තල ගුලි | එකක් | 50 | |
| 92 | තල කැරලි | එකක් | 20 | |
| 93 | අග්ගලා | එකක් | 60 | |
| 94 | හැලප (කුරක්කන් පිටි) | එකක් | 50 | |
| 95 | කොණ්ඩ කැවුම් | එකක් | 70 | |
| 96 | කොකිස් | එකක් | 25 | |
| 97 | පැන් කේක් | එකක් | 50 | |
| 98 | ලැවරිය | එකක් | 60 | |
| 99 | මාළු පැටිස් (ග්‍රෑම් 56) | එකක් | 60 | |
| 100 | බිත්තර පැටිස් (ග්‍රෑම් 56) | එකක් | 60 | |
| 101 | මස් පැටිස් (ග්‍රෑම්56) | එකක් | 60 | |
| 102 | මාළු චයිනිස් රෝල්ස් (ග්‍රෑම් 112.5) | එකක් | 70 | |
| 103 | බිත්තර චයිනිස් රෝල්ස් (ග්‍රෑම් 112.5) | එකක් | 70 | |
| 104 | මස් චයිනිස් රෝල්ස් (ග්‍රෑම් 112.5) | එකක් | 70 | |
| 105 | මාළු කට්ලට් (ග්‍රෑම් 56) | එකක් | 40 | |
| 106 | බිත්තර කට්ලට් (ග්‍රෑම් 56) | එකක් | 50 | |
| 107 | මස් කට්ලට් (ග්‍රෑම් 56) | එකක් | 50 | |
| 108 | මාළු පේස්ට්‍රි (ග්‍රෑම් 56) | එකක් | 70 | |
| 109 | බිත්තර පේස්ට්‍රි (ග්‍රෑම් 56) | එකක් | 70 | |
| 110 | මස්පේස්ට්‍රි (ග්‍රෑම් 56) | එකක් | 70 | |

සිසිල් බීම වර්ග

| අංකය | සැපයිය යුතු ආහාර වර්ගය | ප්‍රමාණය | අපේක්ෂිත උපරිම මිල | ඉදිරිපත් කරනු ලබන මිල |
|---|---|---|---|---|
| 111 | පැණි බීම බෝතල් | එකක් | පාලන මිල | |
| 112 | පළතුරු බීම බෝතල් | එකක් | පාලන මිල | |
| 113 | කිරි පැකට් | එකක් | පාලන මිල | |
| 114 | නැවුම් පළතුරු බීම | වීදුරුවක් (400 ml) | 100 | |

- දීසියක් වශයෙන් හදුන්වා ඇත්තේ පුරවන ලද තේ පීරිසියකින් එකකි.
- එසේම පාලන මිලට විකුණනු ලබන ආහාර සඳහා පාලන මිල යනුවෙන් සඳහන් කරන්න.

(උදාහරණ -කිරි පැකට් එකක්)

"ඇ" උපලේඛනයේ ඉහත සඳහන් මිල ගණන් යටතේ හෝ මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සංශෝධනය කරනු ලබන මිල ගණන් යටතේ අදාල අයිතමයන් අලෙවි කිරීමට ද මෙම උපලේඛනයේ සඳහන් නොවන ආහාර ද්‍රව්‍යයන් අලෙවි කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) මඟින් පූර්ව අනුමැතියන් ලබා ගැනීමට එකඟ වෙමි. තවද ආහාර වර්ග එළවළු හෝ ආහාර පිළියෙල කිරීම සම්බන්ධ වෙනත් ඕනෑම ද්‍රව්‍යයක වෙළඳපොල මිල උච්ඡාවචනය වීමට අනුව කිසිදු අවස්ථාවකදී ඉහත ආහාර මිල ගණන් වැඩි කිරීම හෝ වැඩි කිරීම සඳහා ඉල්ලීම් කිරීම සිදු නොකරන බවට සහතික වෙමි.

.................................

දිනය

.......................................................

මිල ගණන් කරන්නාගේ අත්සන

මිල ගණන් ඉදිරිපත් කරන්නාගේ නම :.........................................................................

ලිපිනය : .............................................................................................................